A3-2

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

510

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය<br>தரம் 7<br>Grade 7 | බුද්ධ ධර්මය I,II පත්‍ර<br>புத்த சமயம் வினாத்தாள்-I-II<br>Buddhism I,II Paper | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

- I කොටසේ 1-20 දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40 යි.
- II කොටසේ පළමු ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න 04 ක් ඇතුළු ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

## I කොටස

01. බුදුසසුනේ බුදුන් දහම් සරණ ගිය ද්වේවාචික උපාසකවරුන් වන්නේ,
    i. තපස්සු හා භල්ලුක දෙදෙනා ය.
    ii. සුජාතා හා විශාඛා සිටු දියණියන් දෙදෙනා ය.
    iii. ආලාර කාලාම හා උද්දක රාමපුත්ත දෙදෙනා ය
    iv. ආනන්ද හා දේවදත්ත කුමාරවරුන් දෙදෙනා ය

02. සම්බුදු පියාණන්ගේ මංගල ධර්ම දේශනය වුයේ,
    i. ආදිත්ත පරියාස සූත්‍රය යි.
    ii. මහා මංගල සූත්‍රය යි.
    iii. දම්සක් පැවතුම් සූත්‍රය යි.
    iv. කරණීය මෙත්ත සූත්‍රය යි.

03. භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙස් බිඳ දමා නිවනට ගමන් කළ හෙයින් ද, යහපත් ගමන් ඇති හෙයින් ද, සුන්දර වචන ප්‍රකාශ කරන හෙයින් ද,
    i. ලෝක විදූ නම් වෙති.
    ii. සුගත නම් වෙති.
    iii. අනුත්තර පුරිසදම්ම සාරථී නම් වෙති.
    iv. සත්ථා දේවමනුස්සානං නම් වෙති.

04. බුදු සසුනේ " මිගාර මාතා " නමින් ප්‍රසිද්ධ වුයේ,
    i. විශාඛා සිටු දියණිය යි.
    ii. ඛේමා රාජ දේවිය යි.
    iii. මාගන්දිය බැමිණිය යි.
    iv. සුජාතා සිටුදුව යි.

05. බුදුදහමට අනුව අප තවත් කෙනෙකුට ගෞරව කළ යුත්තේ ඔහුගේ,
    i. ධනවත්කම අනුව යි.
    ii. ගුණවත්කම අනුව යි.
    iii. කුලවත්කම අනුව යි.
    iv. බලවත්කම අනුව යි.

06. ඉවසීමෙන් ලැබෙන ආනිසංස අතරින් එකකි,

i. අමනුෂ්‍ය භය දුරු වීම
ii. නපුරු සිහින නොපෙනීම
iii. මිතුරන් බහුල පුද්ගලයකු වීම
iv. ධන සම්පත් ලැබීම

07. බෞද්ධයාගේ අත් පොත වන "ධම්ම පදය "අයත් වන්නේ,

i. ඛුද්දක නිකායට ය.
ii. දීඝ නිකායට ය.
iii. සංයුක්ත නිකායට ය.
iv. මජ්ඣිම නිකායට ය.

08. පිරුවානා පොත් වහන්සේට ඇතුළත් තුන් සූත්‍රයෙන් එකකි,

i. පරාභව සූත්‍රය.
ii. දම්සක් පැවතුම් සූත්‍රය.
iii. චුල්ලරාහුලෝවාද සූත්‍රය.
iv. රතන සූත්‍රය.

09. සොරෙන් හෝ බලෙන් අන්සතු දේ ගැනීමෙන් වැළකී සිටීම පංච ශීලයට අනුව,

i. පළමු සිල්පදයයි.
ii. දෙවන සිල්පදයයි.
iii. තෙවන සිල්පදයයි.
iv. සිව්වන සිල්පදයයි.

10. තුන් ලොව තතු ලෙසට - දැනගෙන නොදත් මෙලොවට
දෙසුයෙන් නියම කොට - ලෝකවිදූ යැයි කියති මුනිදුට
මෙම කවිය අඩංගු බෞද්ධ ග්‍රන්ථය වන්නේ,

i. කව්සිළුමිණ යි.
ii. පූජාවලිය යි.
iii. ලෝවැඩ සඟරාව යි.
iv. බුදුගුණ අලංකාරය යි.

11. බුදුරජාණන් වහන්සේ ලංකාවට පළමු වරට වැඩම කළේ,

i. පොසොන් පෝ දිනයේදී ය.
ii. ඇසළ පෝ දිනයේදී ය .
iii. වෙසක් පෝ දිනයේදී ය.
iv. දුරුතු පෝ දිනයේදී ය.

12. සුඛෝපභෝගී ජීවිතය ගැන මහත් සේ කලකිරී ජීවිතයේ සැනසිල්ල සොයමින් පැමිණි තැනැත්තෙකු වූයේ,

i. අනේ පිඬු සිටු ය.
ii. ධනංජය සිටු ය .
iii. යස කුල පුත්‍ර ය.
iv. මිගාර සිටු ය.

13. මෙලොව පරලොව දියුණුව උදා කරන උතුම් ගුණාංගයක් ලෙස "ඉවසීම " හඳුන්වා දිය හැකිය. බුද්ධ චරිතයේ එම ගුණය ඉස්මතු වන අවස්ථාවක් ලෙස දැක්විය හැක්කේ,

i. චිංචි මානවිකාව පිළිබඳ සිදුවීම යි.
ii. ද්‍රෝණ බමුණා පිළිබඳ සිදුවීම යි.
iii. සෝණදණ්ඩ බමුණා පිළිබඳ සිදුවීම යි.
iv. සුද්ධෝදන රජු පිළිබඳ සිදුවීම යි.

14. තම අසරණ දෙමාපියන්ට සැලකූ කුරුලු පැටවෙකු පිළිබඳ සඳහන් වන ජාතක කථාව වන්නේ,

i. සාම ජාතකය යි.
ii. වණ්ණුපථ ජාතකය යි.
iii. මඛාදේව ජාතකය යි.
iv. සාලිකේදාර ජාතකය යි.

15. රාත්‍රී සැතපීමට පෙර තම ගුරුවරයා වූ අස්සජි තෙරුන් වෙසෙන විහාරය දෙසට හැරී වන්දනා කළ බෞද්ධ භික්ෂුන් වහන්සේ වූයේ,

i. රාහුල රහතන් වන්සේ ය.
ii. මහා කාශ්‍යප රහතන් වහන්සේ ය.
iii. සැරියුත් මහ රහතන් වහන්සේ ය.
iv. ආනන්ද මහ රහතන් වහන්සේ ය.

16. තමාගේත් අනුන්ගේත් යහපත පිණිස හේතු වන අයුරින් ධනය වැය කළ යුතු බව පෙන්වා දෙන බෞද්ධ සූත්‍රය වන්නේ,

i. පත්ත කම්ම සූත්‍රය යි.
ii. සිගාලෝවාද සූත්‍රය යි.
iii. මහා මංගල සූත්‍රය යි.
iv. රතන සූත්‍රය යි.

17. වී ගොවිතැන හා සම්බන්ධ චාරිත්‍ර අතර වැදගත් තැනක් ගන්නේ,

i. අග්‍රශෂ්‍ය දානය යි.
ii. සාංඝික දානය යි.
iii. කඨින දානය යි.
iv. ආමිස දානය යි.

18. එදා මෙදා තුර ලොව පහළ වූ ගුණවතුන් හා නැණවතුන් අතර අති ශ්‍රේෂ්ඨ පුද්ගලයා වන්නේ බුදුරජාණන් වහන්සේය. නව ගුණ පාඨයට අනුව පළමු බුදුගුණය ලෙස දැක්වෙන්නේ,

i. සුගතෝ බුදු ගුණය යි.
ii. අරහං බුදු ගුණය යි.
iii. ලෝකවිදූ බුදු ගුණය යි.
iv. භගවා බුදු ගුණය යි.

19. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයෙකු නොවන්නේ,

i. සුනීත ය.
ii. සෝපාක ය.
iii. රජ්ජුමාලා ය.
iv. බේමා ය.

20. ජේතවනාරාමය තැනවීම සඳහා අනේපිඬු සිටුතුමා වියදම් කළ කහවණු ගණන වන්නේ,

i. පණස් හතර කෝටියකි.
ii. පණස් කෝටියකි.
iii. හතලිස් අට කෝටියකි.
iv. හතලිස් හය කෝටියකි.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නයට **හා** තවත් **ප්‍රශ්න හතරකට** පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60 කි.

01. පහත සඳහන් ප්‍රශ්න වලට , දෙවන වාරයේදී ඔබ විසින් සිදු කරනු ලැබූ ඇගයීම ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. දෙවන වාරයේදී ඔබ සිදු කළ ඇගයීමේ නම කුමක් ද? (ලකුණු 02)
ii. එම ඇගයීම සඳහා ඔබට උදව් කළ දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 04)
iii. ඇගයීමට යොදාගත් අමුද්‍රව්‍ය දෙකක් ලියන්න. (ලකුණු 04)
iv. මෙම ඇගයීමේ දී ඔබ මුහුණ දුන් ගැටලුවක් ලියන්න. (ලකුණු 04)
v. මෙම ඇගයීම සඳහා ගුරුතුමිය හෝ ගුරුතුමා විසින් ඔබ වෙත පවරන ලද කාර්යභාරය කවරේදැයි ලියා එම ඇගයීමෙන් ඔබ ලද අත්දැකීම් දෙකක් ලියන්න . (ලකුණු 06)

02. " යමෙක් ගිලනුන්ට උපස්ථාන කරන්නේ ද, හෙතෙම මට උපස්ථාන කරන්නේය." යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

i. බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට පිහිට වූ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)
ii. ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)
iii. උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග පහ ලියන්න. (ලකුණු 05)

03. i. නිවන් ප්‍රාර්ථනා කරන මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග රැසක් පෙන්වා දෙන බෞද්ධ සූත්‍රයේ නම කුමක්ද ? (ලකුණු 02)
ii. මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)
iii. පාසල් යන සිසු දරුවන් වශයෙන් මිතුරුකමින් ජීවත් වීමේ වැදගත්කම කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. i. බුදුරජාණන් වහන්සේගේ අග්‍ර දායකයාගේ හා අග්‍ර දායිකාවගේ නම් මොනවාද ? (ලකුණු 02)
ii. අග්‍ර දායකයාගේ චරිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ 03 ක් ලියන්න. (ලකුණු 03)
iii. ධනංජය සිටුතුමා පති කුලයට යන තම දියණියගේ ජීවිතය සාර්ථක කර ගැනීමට ලබා දුන් උපදෙස් දහයෙන් පහක් ලියන්න. (ලකුණු 05)

05. බෞද්ධ අපගේ නිත්‍ය ශීලය වන්නේ පංච ශීලය යි.

i. පංච ශීලයේ පළමු හා දෙවන සිල්පද දෙක ලියන්න. (ලකුණු 02)
ii. විරතිය හා සමාදානය යන වචන දෙක පැහැදිලි කරන්න. (ලකුණු 03)
iii. මත්වතුරට හා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමෙන් සමාජයට වන අයහපත කවරේද ? (ලකුණු 05)

06. තම ශිෂ්‍යයාට එල්ල වන විවිධ කරදර හිරිහැරවලින් ඔහු මුදවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සැබෑ ගුරුවරයෙකුගේ ලක්ෂණයකි.

i. ගුරු - සිසු සම්බන්ධතාව පෙන්වා දෙන බෞද්ධ සූත්‍රයේ නම කුමක් ද? (ලකුණු 02)
ii. ශිෂ්‍යයෙකු විසින් ගුරුවරයෙකුට ඉටු කළ යුතු කාර්ය පහෙන් තුනක් ලියන්න. (ලකුණු 03)
iii. ගුරුවරයෙකු විසින් ලබා දෙනු ලබන උපදෙස්වලට හොඳින් සවන් දීමෙන් අපේ ජීවිතයට ඇතිවන යහපත කවරේද ? (ලකුණු 05)

07. i. නායකයා ඥානවන්ත වීමෙන් සමෘද්ධියට පත් වූ වෙළඳ කණ්ඩායමක් පිළිබඳව දැක්වෙන බෞද්ධ ජාතක කථාවේ නම කුමක්ද ? (ලකුණු 02)
ii. නායකත්වයේ ගුණාංග රැසකි. ඉන් තුනක් ලියන්න. (ලකුණු 03)
iii. ශිෂ්‍ය නායකයෙකු / නායිකාවක වශයෙන් පාසලේදී ඔබට පැවරෙන වගකීම් පහක් ලියන්න. (ලකුණු 05)